**පානදුර නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 17 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් ලෙස වැය ශීර්ෂ සඳහා රු.29,236,676 ක් ගිණුම් ගත කර තිබුණද ඒ සඳහා ඉදිරිපත් කර තිබූ උපලේඛනය අනුව ගෙවිය යුතු වියදම්වල එකතුව රු.29,394,001 ක් විය.

(ආ) ආයුර්වේද ගබඩා ලේඛනයට අනුව 2014 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ගබඩා තොගය රු.199,931 ක් වුවද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම වටිනාකම රු.76,569 ක් ලෙස දක්වා තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.48,363,261 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.49,804,754 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) 1990 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබූ රු.1,110,074 ක් වූ අත්තිකාරම් 2015 අප්‍රේල් 06 වන විටත් පියවා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 571 අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 2 ක් ඉක්ම වූ රු.3,248,956 ක් වූ තැන්පතු ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට 2015 මාර්තු 13 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ ස්ථාන මාරු වී ගිය එහෙත් විගණිත දිනය වූ 2015 ජූනි වන විටත් අයවීම් සිදු නොවන සේවකයින් 21 දෙනෙකු විසින් ලබා ගෙන තිබූ ණය ශේෂවල එකතුව රු.169,552 ක් වූ අතර දීර්ඝ කාලයක සිට පැවත එන රු.533,879 ක හඳුනා නොගත් සේවක ණය ශේෂයක්ද විය.

(ඇ) 2014 ජනවාරි මස මුදල් බැංකු ගත කිරීම්වලදී අවස්ථා 06 කදි සරප් වෙත ලැබුනු මුදලට වඩා අඩුවෙන් රු.15,141 ක් හා වැඩියෙන් රු.9,812 ක් බැංකු ගත කර තිබුණි.

(ඉ) සභාවේ සභාපතිගේ දැන්වීම මත 2015 ජනවාරි 07 දින සරප්ගේ ලැබීම්වලින් රු.180,632 ක් එදින සරප් රාජකාරිවල වැඩ බැලීම් කර තිබූ ගිණුම් අංශයේ සේවය කරන කාර්යාල කම්කරු තනතුරු දරන සේවකයන් දෙදෙනෙකු විසින් සභාවේ සේවකයන් වෙත අතිකාල දීමනා ලෙස ගෙවා තිබුනු අතර මෙම අතිකාල ගෙවීම් වවුචර් සඳහා ගණකාධිකාරී අනුමැතියද ලැබී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 42,830 | 28,257 | 28,095 |
| (ii) බදු කුලී | 3,309 | 2,750 | 959 |
| (iii) බලපත්‍ර ගාස්තු | 220 | 218 | 2 |

### 2.3.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.27,948,654 ක් විය. මින් අවුරුදු 3 ට වැඩි කාලයක සිට හිඟව පැවත එන ශේෂය රු.4,500,424 ක් වූ අතර ඉන් රු.50,000 ට වැඩි හිඟ ශේෂවල එකතුව රු.1,203,831 ක් විය.

### 2.3.3 කර්මාන්ත හා ව්‍යාපාර බදු

2010 වර්ෂයේ හිඟ ව්‍යාපාර බදු අයකරගැනීම සඳහා සභාව මගින් නඩු පැවරීමෙන් පසු බදුකරුවන් විසින් උසාවියට ගෙවා තිබූ රු.25,900 ක බදු මුදල් සභාවට ගෙන්වාගැනීමට විගණිත දිනය වූ 2015 මාර්තු 11 වන විටත් කටයුතු කර නොතිබුණි.

### 2.3.4 කඩකුලී

(අ) 2014 වර්ෂයට පෙර වර්ෂයන්ට අදාල රු.311,660 ක්ද, 2014 වර්ෂයට අදාල රු.179,350 ක්ද වූ හිඟ කඩකුලී 2015 අප්‍රේල් 30 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මාර්කට් පාරෙහි අංක L2 දරන මාළු වෙළඳසැලෙන් 2013 දෙසැම්බර් මාසයේ සිට 2014 සැප්තැම්බර් මාසය දක්වා රු.55,500 ක හිඟ කඩ කුලී ශේෂයක් විය. මේ සඳහා බදු කුලී ගිවිසුමක්ද නොතිබුණි.

(ඇ) අංක 8 දරන මාලු වෙළඳසැල 2009 වර්ෂයේ සභාපතිගේ සටහනක් මගින් ගිවිසුමකින් තොරව මාස 03 ක කාලයක් සඳහා බදු දී තිබූ අතර එම පුද්ගලයා මාස 03 ඉක්මවීමෙන් පසුද වෙළඳ සැල සභාවට භාර දී නොතිබීම නිසා සභාව විසින් නඩු පවරා තිබුණි. 2013 සැප්තැම්බර් මාසය දක්වා

සභාව විසින් මෙම වෙළඳසැල සඳහා බිල් කර තිබූ කුලිය රු.77,000 ක් විය. 2014 දෙසැම්බර් 19 දින ලැබී තිබූ නඩු තීන්දුව අනුව වෙළඳසැල සභාවට පවරාගැනීමටත්, කුලී මුදල් කපාහැරීමටත් තීරණය වී තිබුණි. මෙම නඩු සඳහා 2014 වර්ෂය තුළ පමණක් නඩු ගාස්තු ලෙස සභාව මගින් රු.62,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) එකතුව රු.283,160 ක් වූ හිඟ කඩ කුලී ශේෂයක් පැවති වෙළඳසැල් 32 ක ලිපිගොනු, නඩු පැවරීම සඳහා 2013 වර්ෂයේ නීතිඥවරියක් වෙත භාර දී තිබුණද එකී ගිවිසුම්වල අඩුපාඩු පැවති බව දන්වා තිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2015 මාර්තු 13 දින වන විටත් නඩු පැවරීම සිදු කර නොතිබුණි.

2.3.5 **ඉඩම් විකිණීම මත අයකරනු ලබන 1% ක බදු මුදල්**

(අ) නගර සභා ආඥා පනතේ (255 අධිකාරියේ ) 165(ඇ) I වගන්තිය ප්‍රකාරව කට්ටි කර ඉඩම් විකිණීම්වලදී විකුණුම් මිලෙන් සියයට 1 කට සමාන මුදලක් බදු වශයෙන් අය කළ යුතු වුවත් 2014 වර්ෂයේදී ඉඩම් විකිණීම් 4 කින් අයකරගනු ලැබූ සියයට එකක බදු මුදල රු.1,686,650 ක් වුවද එය සත්‍ය විකුණුම් මිලෙන් සියයට එකක් නොවූ අතර ආදායම් පරිපාලක විසින් විකුණුම් මිල යැයි ඇස්තමේන්තු කරනු ලැබූ මුදලින් සියයට එකක් පමණක් විය.

(ආ) එසේම, එක් මානක සැළසුමකට අදාල බිම් කට්ටි 4 ක් සඳහා විකුණුම් මිල ලෙස ආදායම් පරිපාලක විසින් අවස්ථා දෙකකදී එකිනෙකට වෙනස් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර ඒ අනුව ඉඩම්වල විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමේදී නිශ්චිත හෝ පිළිගත් ප්‍රතිපත්තියක් හෝ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

වෙසක් සමාධි කලාපය තුළ පවත්වා තිබූ පහන් කූඩු තරඟය සඳහා ත්‍යාග ලබාදීම වෙනුවෙන් සභාව විසින් රු.31,500 ක් වැය කර තිබූ නමුත් ඒ සඳහා නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 159(ඊ) වගන්තිය අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.2 **අවිධිමත් ගනුදෙනු**

2014 වර්ෂයේ සාහිත්‍ය උත්සවය වෙනුවෙන් මහජන ආධාර අනුග්‍රහ දායකත්ව ලෙස රු.37,500 ක මුදලක් මුදලින් ලැබී වියදම් කර තිබූ අතර ඒ සඳහා ලදුපත් නිකුත් කර නොතිබූ අතරම එම වියදම් සඳහා ගෙවීම් වවුචර් පිළියෙල කර ගිණුම් ගත කර නොතිබුණි.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) **එකම කාලසීමාවක් තුළ කොන්ත්‍රාත් කිහිපයක් ඉටු කර ඇති සමිති**

2011 සැප්තැම්බර් 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 452 ට අනුව ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී, කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදී අදාල ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 3 කට වඩා වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත් එයට පටහැනිව එකම කාලසීමාවක් තුළ එක් සමිතියක් විසින් කොන්ත්‍රාත් 06 ක් සහ තවත් සමිතියක් කොන්ත්‍රාත් 08 ක් ඉටු කර තිබූ බව 2014 ඔක්තෝබර් මාසයේ කරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) **ඉදිකිරීම් පිළිබඳ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු**

2015 මාර්තු 18 දින සභාවේ මාර්ග හා ඉදිකිරීම් පිළිබඳව සිදු කළ ස්ථානීය ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(i) <u>නගර සභා ක්‍රීඩාගාරයේ අළුත්වැඩියාව</u>**

(අ) නගර සභා ක්‍රීඩාගාරයේ ඉදිකිරීම්, අදියර 3 යටතේ සිදු කර තිබූ අතර එම සියළු ඉදිකිරීම් 2014 සැප්තැම්බර් 11 දිනට නිම කර තිබුණි. විගණිත දිනය වූ 2015 මාර්තු 18 දිනට වැඩ නිම කර මාස 06 ක් වැනි කෙටි කාලයක් ගතවී තිබුණද ක්‍රීඩාගාරයේ පොළොවේ කොන්ක්‍රීට් මත අලුතෙන් දැමූ සිමෙන්ති තැනින් තැන පුපුරා ගොස් තිබූ අතරම ඇතැම් ස්ථාන කැඩීයාමෙන් නැවත පිරවුම් සිදු කර තිබුණි.

(ආ)ක්‍රීඩාගාරයේ පිවිසුම් කවුලුවේ ඉහත (මුදුනත) බිත්තියේ කපරාරුව මීටර් 3 ක් පමණ දිගට පුපුරා කොන්ක්‍රීට් කොටස ගැලවීමට ආසන්න තත්වයේ පැවතුණි.

**(ii) <u>සිංසැප මාවත ඉදිරිපිට ගාමිණී කොස්තා මාවත ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම</u>**

ඉහත මාර්ගය සහා අරමුදල් යටතේ සිදු කර 2014 ඔක්තෝබර් 10 දිනට වැඩ අවසන් කර තිබූ අතර මාර්ගය හරි මැදට වන්නට (බැවුම ආරම්භ වන ස්ථානයේ ) මාර්ගය හරහා දිගටම පිපිරීමක් නිරීක්ෂණය විය.

**(iii) <u>දිබ්බැද්ද පාර (ගාඩ් වත්ත පාර) අතුරු මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම</u>**

මෙම මාර්ගයේ ආරම්භක කොටසේ කොන්ක්‍රිට් තට්ටුව කැඩී ඇඩි ලෙස අබලන්ව පැවති අතර ජලය බැස යාම සඳහා කාණු පද්ධතියක්ද නොවීය. එලෙස පැවතියදී එම මාර්ගය ආසන්නයේ පිහිටි නිවාස 02 ක් ඉදිරිපිට වර්ග අඩි 37.5 ක් වූ වටරවුම පමණක් රු.129,741 ක් වැය කර 2014 වර්ෂයේ අලුතින් කොන්ක්‍රීට් කර තිබුණි.

(ඇ) **<u>මග නැගුම මාර්ග සංවර්ධන වැඩසටහන</u>**

මග නැගුම මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වැඩ නිම කළ ඉදිකිරීම් සඳහා වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයෙන් අරමුදල් ලැබී නොතිබියදී 2013 හා 2014 වර්ෂවල ව්‍යාපෘති 47 ක් සඳහා පිළිවෙලින් රු.5,040,575 ක්, හා රු.5,166,022 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. විගණිත දිනය වූ 2015 මාර්තු 18 දින වන විටත් ඒ සඳහා වූ මුදල් සභාවට ප්‍රතිපූර්ණය වී නොතිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් වූ සියයට 10 ක රඳවාගැනීම්ද ඇතුළුව ලැබිය යුතු මුදල රු.7,522,141 ක් හා රු.9,495,476 ක් විය.

3.4 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) **<u>සේවක ඇප</u>**

පළාත් පාලන කොමසාරිස් (බ.ප.) ගේ 2004 ජූලි 9 දිනැති අංක LG/05/2004 දරන චක්‍රලේඛයේ 02 ඡේදය හා 1992 ජනවාරි 29 දිනැති අංක 3/4/1 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය ප්‍රකාරව ඇප තැබිය යුතු සේවකයින් 46 දෙනෙකු ඇප තබා නොතිබුණි. සභාවෙන් මාරු වී ගොස් ඇති නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයකරගෙන තිබූ රු.17,969 ක ඇප මුදල් එම නිලධාරීන් වෙත 2015 මාර්තු 13 දින වන විටත් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **<u>සැළසුම් කමිටු දීමනා ගෙවීම</u>**

2004 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක LG/07/2004 දරන චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව සැළසුම් කමිටුවෙන් පරීක්ෂාවට භාජනය වන අයදුම්පත් ගණන අවම වශයෙන් 10 කට වැඩි නම් හෝ පැය 2 කට වඩා වැඩි කාලයක් කමිටුව පැවැත්වේ නම් රාජකාරි වේලාවෙන් බැහැරව සැළසුම් කමිටුව පැවැත්විය යුතු විය. එනමුත් 2014 වර්ෂයේ මාස 3 කදී රාජකාරි වේලාවෙන් පසු පැය 2 කට අඩුවෙන් කමිටු පවත්වා දින 04 ක් සඳහා රු.24,300 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) **සැළසුම් අනුමත කිරීම**

අංක BP/176/2013 දරන ගොනු අංකය යටතේ ඉදිරිපත් කර තිබූ පළමු ඉඩම් සැලැස්මේ දක්වා තිබූ ප්‍රවේශ මාර්ගය ප්‍රමාණවත් නොවීම නිසා සංවර්ධනකරු විසින් ඉඩමට ඇතුල්වීමට ඇති නගර සභා මාර්ග දෙකක් සම්බන්ධ කර නැවත පිඹුර සකස් කර ඉදිරිපත් කර තිබූ අතර එය නාගරික සංවර්ධන අධිකාරිය විසින් තම රෙගුලාසිවලට අනුව ප්‍රමාණවත් බව දක්වා තිබුණි. ඒ අනුව 2014 ඔක්තෝබර් 16 දින සභාවේ පැවති සැළසුම් කමිටුව මගින් අනුබෙදුම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. මෙම ඉඩම් කොටසට සම්බන්ධ මාර්ග සම්බන්ධයෙන් 2015 මාර්තු 18 දින සභාවේ වැඩ අධිකාරී සමග සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ ඉඩමට පිවිසීමට සම්බන්ධ කර ඇති විකල්ප ප්‍රවේශ මාර්ගය නගර සභා ප්‍රවේශ මාර්ගයට කිසිදු සම්බන්ධයක් නොමැති බවත් එම ස්ථානය වැසි වතුර ගලා යාම සඳහා පෞද්ගලික ඉඩමකින් ලබාදී තිබූ කාණුවක් බවත්ය.

(ඈ) **ආහාර සාම්පල් පරීක්ෂා කිරීම හා නඩු පැවරීම**

(i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු තම කලාපයෙන් මසකට අවම වශයෙන් ආහාර සාම්පල් 2 ක් වත් පරීක්ෂා කළ යුතු වුවත් 2014 වර්ෂයේ නගර සභා බල ප්‍රදේශයේ කලාප 3 න්ම ආහාර සාම්පල් ලබාගෙන තිබුණේ ආයතන 07 කින් පමණක් වන අතර දින 02 කදී සිදු කළ පරීක්ෂාවලින් නඩු 05 ක් පමණක් පවරා තිබුණි.

(ii) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ ආහාර සාම්පල් සම්බන්ධයෙන් පවරා තිබූ නඩු සඳහා දඩ ලෙස උසාවිය අය කර තිබූ රු.50,000 කින් සභාවට ලැබිය යුතු සියයට 75 ක ප්‍රමාණය වූ රු.37,500 ක මුදල 2015 ජූනි 15 වන විටත් ගෙන්වා ගෙන නොතිබුණි.

(ඉ) **මානව සම්පත් කළමනාකරණය**

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 252 ක් වූ අතර විවිධ තනතුරු 13 ක නිලධාරීන් 18 ක් එදිනට පුරප්පාඩු වී තිබුණද එම තනතුරු සඳහා බඳවාගැනීම් කිරීමට කටයුතු නොකර අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව ස්ථිර තනතුරු 42 ක්ද, ආදේශක තනතුරු 17 ක්ද, වෙනත් තනතුරු 07 ක්ද සඳහා බඳවාගැනීම් සිදු කර තිබුණි. ඊට අමතරව වැඩ බැලීමේ තනතුරු 02 ක්ද 2013 ඔක්තෝබර් 24 හා 2015 පෙබරවාරි 24 දින සිට ක්‍රියාත්මක විය.

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

2010 වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සහ සභා අරමුදල් මගින් එකතුව රු.774,593 ක් වැය කර ඉදි කර තිබූ ජීව වායු ඒකකය ක්‍රියාත්මක නොවීම හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අරමුදල් දායකත්වයෙන් 2014 වර්ෂයේ නිම කිරීමට යෝජිත වූ අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් දිගින් දිගටම ප්‍රමාද වී තිබීම නිසා සභා බල ප්‍රදේශයේ එකතු වන කසල අපහරණය කිරීම වෙනුවෙන් 2014 වර්ෂයේ මොරටුව මහ නගර සභාවට සහ පෞද්ගලික ආයතනයන් වෙත රු.4,878,465 ක් ගෙවා තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වියදම් පරිපාලනය

(ඈ) තොග පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) ව්‍යාපෘති පරිපාලනය